**ශීර්ෂය 283- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 283 වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුනි 30 දින දෙපාර්තමේන්තුවේ වන සංරක්ෂක ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන් දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 2,046.34 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 2,032.02 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 14.32 ක් හෙවත් සියයට 0.70 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 1,198.59 | 1,188.99 | 9.60 | 0.80 |
| මූලධන | 847.75 | 843.03 | 4.72 | 0.56 |
| **එකතුව** | **2,046.34** | **2,032.02** | **14.32** | **0.70** |

## 2.2 ආදායම් ගිණුම්

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා ආදායම් සංකේත දෙකක් සඳහා එකතුව රු.මිලියන 1,180 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 1,406.2 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 119 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 10:03:07:03 | 80.00 | 87.65 | 7.65 | 9.56 |
| 20:02:01:02 | 1,100.00 | 1,318.52 | 218.52 | 19.87 |
| එකතුව | **1,180.00** | **1,406.17** | **226.17** | **19.17** |

## 2.3 අත්තිකාරම් ගිණුම

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 28301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 72.50 | 63.67 | 58.50 | 65.91 | 274.00 | 215.96 |

### 2.3.2 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0045/0015/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 228.77 ක් විය.

### 2.3.3 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ තැන්පත් ගිණුම් 06 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 311.65ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට හර ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0020/000 | 164.12 |
| 6000/0000/00/0002/0103/000 | 0.19 |
| 6000/0000/00/0006/0021/000 | 132.28 |
| 6000/0000/00/0013/0069/000 | 18.17 |
| 6000/0000/00/0015/0138/000 | (3.21) |
| 6000/0000/00/0016/0051/000 | 0.10 |
| **එකතුව** | **311.65** |

### 2.4 විගණන නිරීක්ෂණය

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

### 3.2 විසර්ජන ගිණුම

### 3.2.1 අයවැය විචලනය

වැය විෂයයන් 07 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට24 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 3.3 පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.8,350,620 ක්වූ තැන්පතු 59 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 3.4 ආදායම් ගිණුම්

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරි වශයෙන් ආදායම් සංකේත 02 ක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවැරි තිබුණි. එම ආදායම් සංකේතවලට අදාලව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) 20:02:01:02 දරන ආදායම් සංකේතය - රජයේ කැලෑවලින් ලැබෙන ආදායම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් සංකේතයට ආදාළව රු.මිලියන 1,100 ක ආදායමක් රැස්කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 1,318.5 ක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 119.86 ක් වී තිබුණි.

(ii) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු. මිලියන 2,028 ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟ හිට් ආදායම වර්ෂ 01 සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයකට අදාළ විය. හිඟහිට් ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(iii) මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාරව ආදායම් සංකේතයට අදාළ අර්ධ වාර්ෂික හිඟ ආදායම් පිළිබඳ වාර්තා පිළියෙල කර නොතිබුණි.

(iv) රාජ්‍ය දැව සංස්ථාවෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ලැබිය යුතු ස්කන්ධභාග මුදල් සහ රාජ්‍ය දැව සංස්ථාවෙන් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ස්කන්ධභාග මුදල් අතර රු. 878,986,751 ක වෙනසක් පැවැතුණි.

**(ආ) 10:03:07:03 දරන ආදායම් සංකේතය - පුද්ගලික දැව ප්‍රවාහනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් සංකේතයට ආදාළව රු.මිලියන 80 ක ආදායමක් රැස්කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට

රු.මිලියන 87.7 ක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 109.63 ක් වී තිබුණි.

(ii) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු. 918,067 ක ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායම වර්ෂ 01 සිට වර්ෂ 04 ක් දක්වා කාල පරාසයකට අදාළ විය. හිඟහිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(iii) මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාරව ආදායම් සංකේතයට අදාළ අර්ධ වාර්ෂික හිඟ ආදායම් පිළිබඳ වාර්තා පිළියෙල කර නොතිබුණි.

## 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 28301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.9,202,251 ක්වූ අතර, එම හිඟහිට ශේෂ මාස 01 ක සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක සිය පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට හිගහිට තිබුණු ණය ශේෂවල එකතුවෙන් රු.2,149,378 ක් මියගිය, විශ්‍රාම ගිය හා වෙනත් රාජ්‍ය ආයතනවලට ස්ථාන මාරු වී ගිය වර්ෂ 05 ට වැඩි කාලයක සිට පැවත එන ශේෂ විය.

## 3.6 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.6.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2015 නොවැම්බර් 27 දින පිළියෙල කර තිබුණි.

### 3.6.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කර භාණ්ඩ හා සේවා ලබා ගැනීමට වාර්ෂික අයවැය ඇස්තමේන්තු අනුව රු.මිලියන 2,046.34 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් අනුමත කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම සඳහා 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම 2015 දෙසැම්බර් 18 දින පිළියෙල කර තිබුණි.

## 3.7 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එම වාර්තා 2016 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

**3.8 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) **ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| 2009 අංක 15 දරන කැලෑ සංශෝධන පනතින් සංශෝධිත (451 වැනි අධිකාරය ) කැලෑ ආඥා පනතේ 64 වැනි වගන්තිය යටතේ 1979 අංක 05 දරන කැලෑ නියෝග | 409,569 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවකයන් තිදෙනෙකුට එකතුව රු.409,569 ක් වූ සේවක දීමනා කැලෑ අරමුදලේ විධිවිධානයන්ට පටහැනිව අරමුදල මගින් ගෙවා තිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 94 | 5,568,969 | දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් 31 දිනට සළසා තිබුණු ප්‍රතිපාදන ඉක්මවා බාහිර පාර්ශවයන් වෙත බැදීම්වලට එළඹ තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 104 | - | සමහර හානිවීම් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ යුතුව තිබුණු වාර්තා දීර්ඝ ප්‍රමාදයකින් පසුව ඉදිරිපත් කර තිබුණි. |

**3.9 විදේශාධාර ව්‍යාපෘති**

සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් විදේශ මුල්‍යාණය යටතේ ව්‍යාපෘති 02 ක් ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘති ගිවිසුම් අනුව එහි ඇස්තමේන්තුගත පිරිවැය එකතුව රු.මිලියන 747.33 ක් වී තිබුණු අතර, එම ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 170.23 ක් උපයෝජනය කර තිබුණි. මෙම විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට වනාන්තර හරණය හා වනාන්තර හායනය මඟින් විමෝචනය වන හරිතාගාර වායු අඩු කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා වැඩසටහන ව්‍යාපෘතියේ කාලයෙන් සියයට 86 ක් අවසන් වී තිබුණද, ව්‍යාපෘතිය සඳහා සලසා තිබුණු මුළු ප්‍රතිපාදනවලින් සියයට 56 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ආ) ප්‍රජා වන කළමනාකරණ වැඩසටහන් ව්‍යාපෘතියට අදාළව කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන වගා ප්‍රදේශයන් තුනක් නියැදි වශයෙන් පරීක්ෂා කරන ලද අතර එයින් වගාවන් දෙකක්ම විනාශ වී පැවතුණි.

## 3.10 කාර්යසාධනය

-----------------

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

--------------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුනොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) ශ්‍රී ලංකා මධ්‍යම කඳුකරයේ කඳු මුදුන් සංරක්ෂණය කිරීම සඳහා රු. මිලියන 10 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදනවලින් හෙක්ටයාර් 484.3 ක නඩත්තු කටයුතු සිදු කළ යුතු වුවද, කාර්යසාධන වාර්තාවට අනුව හෙක්ටයාර් 377 නඩත්තු කටයුතු සිදු කර තිබුණි.

(ii) නොමේරූ පැළ වගාවන් නඩත්තු කිරීමේ කාර්යය සඳහා රු. මිලියන 93.31 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඉන් හෙක්ටයාර් 3,988.9 ක වැඩ කටයුතු අවසන් කිරීමට සැලැසුම් කර තිබුණද, කාර්යසාධන වාර්තාවට අනුව නඩත්තු කටයුතු ඉටු කළ ප්‍රමාණය හෙක්ටයාර් 2,422 ක් පමණක් වී තිබුණි.

(iii) ෆයිනස් වන වගා පුළුල් පරාසයක පරිවර්තනය කිරීම හා නඩත්තු කිරීම සඳහා රු. මිලියන 10 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එමගින් හෙක්ටයාර් 321 ක කටයුතු සිදු කිරීමට නියමිතව තිබුණද, හෙක්ටයාර් 177.2 ක කටයුතු සිදු කර තිබුණි.

## 3.11 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

-------------------------------------

### ගැලපුම් කළයුතු ශේෂ

------------------------

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශ ය අනුව නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ කල් ඉකුත් වූ එකතුව රු.957,222 ක චෙක්පත් පැවැතුණි. 2016 මාර්තු 31 දින වන විටත් එම චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.12 පාඩු හා හානි**

----------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) අලාභය රු. 25,000 ට අඩු සිද්ධීන් 33 ක රු. 224,989 ක් ද, අලාභය රු. 25,000 ට වැඩි සිද්ධීන් 63 ක රු. 11,346,303 ක් ද, අලාභහානි 2015 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් පාඩු / අලාභහානිවල ඇතුළත් සිද්ධීන් 68 ක රු.4,662,938 ක් වූ අලාභ සිදු වී වර්ෂ 10 කටත් වැඩි කාලයක් ගත වී තිබුණි.

**3.13 කළමනාකරණ දුර්වලතා**

----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) කුරුණෑගල දිසාවේ ඩබල් කැබ් රථයක් 2013 ජනවාරි 05 දින හා 2013 නොවැම්බර් 19 දින අනතුරුවලට ලක්වීමෙන් පිළිවෙලින් රු.102,424 ක් හා රු. 466,832 ක අලාභ හානි සිදුවී තිබුණි. කැබ් රථයේ රියදුරුගෙන් එම අලාභයෙන් රු. 284,628 ක් හෙවත් සියයට 50 ක් අයකළ යුතු වුවද, එම මුදල 2015 දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කුරුණෑගල දිසාවේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්වල අනවසර පදිංචි කරුවන් විසින් වගා කටයුතු සිදු කර තිබුණු අතර එම භූමි ප්‍රමාණය අක්කර 209 ක් ලෙස හඳුනා ගෙන තිබුණත්, එම අනවසර පදිංචිකරුවන් ඉවත් කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 ජුනි 08 දින දිවි නැගුම තුන්වන අදියර සඳහා ලබා දී තිබුණු රු.152,305 ක් අදාළ කාර්යයන් සඳහා යොදවා ගෙන නොතිබුණි. දෙපාර්තමේන්තුව විසින් අරමුණට පටහැනිව කුරුණෑගල දිසා වන කාර්යාල ගොඩනැගිල්ල වායු සමනය කිරීමට එම ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි.

(ඈ) පිදුරුතලාගල මුරකරු නිල නිවාසය තාවකාලිකව සිවිල් ගුවන්සේවා අධිකාරියට ලබාදී තිබුණු අතර නැවත දෙපාර්තමේන්තුව වෙත භාර දෙන ලෙස 2002 සැප්තැම්බර් 09 දිනැති අංක පීඑම්/19/26/98 නුවරඑළිය දරන ලිපියෙන් ඉල්ලා තිබුණත්, 2015 දෙසැම්බර් 31 දින වන විටත් ලබා දී නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු උසාවි දඩ මුදල් රු.1,130,600 ක් අඩුවෙන් කැලෑ දෙපාර්තමේන්තු අරමුදලෙහි දක්වා තිබු අතර නුවරඑළිය මහාධිකරණයෙන් ලැබිය යුතු හිග ආදායම් රු. 36,335 ක් දෙවරක් ගිණුම් ගත කර තිබුණි.

## 3.14 මානව සම්පත් කළමනාකරණය

2015 දෙසැම්බර් 31 දිනට වූ අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 85 | 63 | 22 |
| (ii) | තෘතියික මට්ටම | 42 | 20 | 22 |
| (iii) | ද්විතියික මට්ටම | 1,383 | 1,088 | 295 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 1,609 | 1,293 | 316 |
| | එකතුව | 3,119 | 2,464 | 655 |